අමාත්‍යාංශ චක්‍රලේඛ අංක : 03 /2010

මගේ අංකය :02/06/04/01TT(Vol-ii )
2010-10-06

පොලිස්පති,
වන සංරක්ෂක ජනරාල්,
දිස්ත්‍රික් ලේකම්වරු / දිසාපතිවරු,
සියලුම ප්‍රාදේශීය ලේකම්වරු,
දුම්රිය සාමාන්‍යාධිකාරී,

## <u>දැව ප්‍රවාහනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම</u>

උක්ත කාරණය සම්බන්ධයෙන් නිකුත් කර ඇති අංක 06/02/05/වෙළුම III හා 1996-12-06 දිනැති අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 17/96 හි පහත සඳහන් ඡේද වහාම ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කරනු ලැබේ.

I අංක 17/96 චක්‍ර ලේඛයේ 04 ඡේදයේ 4.1.7 ඡේදයට ඉක්බිතිව පහත දැක්වෙන ඡේදය 4.1.8 ලෙස එකතු කරනු ලැබේ.

4.1.8 සීමිත (තහනම්) වගී වලට අයත් හල්මිල්ල හා කොහොඹ යන වගී වලින් ගස් දෙකකට නොවැඩි ගණනකින් ලබාගත් කඳන් හෝ එම කඳන් වලින් ඉරන ලද දැව හෝ එම දැව වලින් සාදන ලද ජනේල රාමු, ජනේල පියන්, දොර රාමු හා දොර පියන් ප්‍රවාහනය සඳහා බලපත්‍ර ඉල්ලා සිටින අවස්ථාවක, අදාල ග්‍රාම නිලධාරිගේ වාර්තාව ලබා ගැනීමෙන් පසු ප්‍රාදේශිය ලේකම් විසින් බලපත්‍ර නිකුත් කළ හැක. එසේ වුවද අදාල ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශය තුල ප්‍රවාහනය ඉල්ලා ඇති දැව වගීය වන සංරක්ෂණ දෙපර්තමේන්තුව විසින් වගාකර ඇත්නම් හෝ ප්‍රවාහනයට ඉල්ලා ඇති දැව වගීය හඳුනා ගැනීමට අපහසු අවස්ථාවක හෝ ගස් කපා ඇති ඉඩමට මායිම්ව රජයේ ඉඩමක් ඇති අවස්ථාවක පමණක් අඩවි වන නිලධාරී වෙතින් නිර්දේශය ලබා ගත යුතුය.

II අංක 17/96 චක්‍ර ලේඛයේ 05 ඡේදයේ 5.1, 5.2, හා 5.5 ඉවත් කර පහත දැක්වෙන 5.1 හා 5.2 ඡේදයන් ඊට ආදේශ කරනු ලැබේ.

5.1 සීමිත (තහනම්) වගී වල නොවන ගස් දෙකකට නොවැඩි ගණනකින් ලබාගත් කඳන් හෝ එම කඳන් වලින් ඉරන ලද දැව හෝ එම දැව වලින් සාදන ලද ජනේල රාමු, ජනේල පියන්, දොර රාමු හා දොර පියන් ප්‍රවාහනය සඳහා බලපත්‍ර ඉල්ලා සිටින අවස්ථාවක, අදාල ග්‍රාම නිලධාරිගේ වාර්තාව ලබා ගැනීමෙන් පසු ප්‍රාදේශිය ලේකම් විසින් බලපත්‍ර නිකුත් කළ හැක. එසේ වුවද අදාල ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශය තුල ප්‍රවාහනය ඉල්ලා ඇති දැව වගීය වන සංරක්ෂණ දෙපර්තමේන්තුව විසින් වගා කර ඇත්නම් හෝ ප්‍රවාහනයට ඉල්ලා ඇති දැව වගීය හඳුනා ගැනීමට අපහසු අවස්ථාවක හෝ ගස් කපා ඇති ඉඩමට මායිම්ව රජයේ ඉඩමක් ඇති අවස්ථාවක පමණක් අඩවි වන නිලධාරී වෙතින් නිර්දේශය ලබා ගත යුතුය.

5.2 සීමිත (තහනම්) වර්ග වල නොවන ගස් තුනක් හෝ ඊට වැඩි ප්‍රමාණයකින් ලබා ගත් කඳන් හෝ එම කඳන් වලින් ලබාගත් ඉරූ දැව හෝ එම දැව වලින් සාදන ලද ජනේල රාමු, පැනල් පියන්, දොර රාමු හා දොර පියන් ප්‍රවාහනය සඳහා බලපත්‍ර ඉල්ලා ඇති අවස්ථාවක, අදාල ග්‍රාම නිලධාරීගේ සහ අදාල අඩවි වන නිලධාරීගේ නිර්දේශය ලබා ගැනීමෙන් පසු ප්‍රාදේශීය ලේකම් විසින් බලපත්‍ර නිකුත් කළ හැකිය.

ආර්.එච්.එස්. සමරතුංග
ලේකම්,
පරිසර අමාත්‍යාංශය.

පිටපත් :

01 ජනාධිපති ලේකම්
02 අග්‍රාමාත්‍ය ලේකම්
03 අමාත්‍ය මණ්ඩල ලේකම්
04 ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
05 සෙසු සියලුම අමාත්‍යාංශ ලේකම්වරු
06 පළාත් සභාවල අමාත්‍යාංශ ලේකම්වරු
07 පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරු
08 පළාත් ආණ්ඩුකාර ලේකම්වරු
09 ඉඩම් කොමසාරිස් ජනරාල්
10 මිනුම්පති
11 හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්
12 අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
13 අධ්‍යක්ෂ ජනරාල්, වාරි මාර්ග දෙපාර්තමේන්තුව
14 පළාත් ඉඩම් කොමසාරිස්වරු
15 යුධ හමුදාපති
16 ගුවන් හමුදාපති
17 නාවික හමුදාපති
18 සභාපති ශ්‍රී ලංකා වරාය අධිකාරිය
19 සභාපති, රාජ්‍ය දැව සංස්ථාව
20 සභාපති, මාර්ග සංවර්ධන අධිකාරිය
21 දිසා වන නිලධාරීවරු
22 විගණකාධිපති

} දැනගැනීම සඳහා.